අමුනුකොලේගම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම

01.හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්,මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැගි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් “දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ” සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

1.1 අමුණුකොලේගම එල්ලංගාව හා එහි පිහිටීම

අමුනුකොලේගම එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටා ඇත. පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කුඩා කඳු වැටි වලින් වටවූ එල්ලංගා කිහිපයකින් යුක්ත වේ .පොල්පිතිගම එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ.අඩ බෑවුම් ප්‍රරදේශ හරහා ඉඩම් ව්‍යාප්තව පවතී.වී වගාවට මෙන්ම ගොඩ බෝග වගාවට ගැළපෙන භූමි පද්දතියක් මෙම කඳු වැටි අතර පිහිටා ඇත .හුදකලා කඳු සහ පරාසයන්හි උන්නතාංශය මීටර් 100 සිට 630 දක්වා වෙනස් වේ. කරණම්පොත්ත කන්ද මීටර් 300 නොඉක්මවයි. ගල් ලෙන කන්දේ සහ ඔමාරගොල්ල කන්දේ උස පිළිවෙලින් මීටර් 630 ක් සහ මීටර් 590 ක් වේ. තවද නාගල කන්ද, දෙගොඩතුරාව කන්ද, තලපත්වැව කන්ද යන කඳු පොල්පිතිගම හා යාපහුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පිහිටයි . ප්‍රදේශයේ පවතින ඓතිහාසික රාජධානිය වන ,ඉහල ඕතොට, දිවිගඳහ කෝරළ දෙක සහ ගල්ගමුව මැතිවරණ කොට්ඨාශය පිහිටා ඇත. මෙම කොට්ඨාශය පහතරට වියළි කලාපය (DL1b), පහතරට අතරමැදි කලාපය (IL3) ලෙස විවිධ කෘෂි පාරිසරික කලාප තුනකින් සමන්විත වන අතර ඉතා කුඩා ප්‍රදේශයක් (මුළු භූමි ප්රමාණයෙන් 3%) මැදරට අතරමැදි කලාපයට (IM3b) අයත් වේ.

කුරුණෑගල සිට ඉබ්බාගමුව කුඹුක්ගැටේ හරහා පොල්පිතිගම ඔස්සේ මඩගල්ල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 65ක පමණ දුරින් අමුනුකොලේගම එල්ලංගාව පිහිටා ඇති අතර යාපහුව ඓතිහාසික රාජධානිය ද නුදුරින් පිහිටා ඇත. අමුනුකොලේ එල්ලන්ගාවට නුදුරින් මලියදේව මහරහතන් වහන්සේ වැඩ උන් බව කියවේ . පුරාවෘත වලට අනුව ඓතිහාසික වශයෙන් එල්ලංගාව වැදගත්

තැනක් ගනී. මඩගල්ල මොරගොල්ලාගම අවුකන කලාවැව විජිතපුර හරහා අනුරාධපුරය දක්වා ඉතා පහසුවෙන් ලඟා වියහැකි මාර්ගයක් ද එල්ලන්ගාව හරහා වැටී ඇත .

ඉතා දර්ශනීය කඳු වැටි කිහිපයකින් වටවූ ඉතා දර්ශනීය වු භූමියක පිහිටි මෙම එල්ලංගාව වැව් 12ක් ව්‍යාපෘතිය මගින් හදුනාගෙන පුනරුත්ථාපනය කර ඇත. එහෙත් එල්ලන්ගාව තුල තවත් වැව් 34ක් පමණ පිහිටා තිබේ. මෙම එල්ලංගාවේ ආරම්භය කහල්ල පල්ලෙකැලේ රක්ෂිතය දක්වා ව්‍යාප්තව පවතී. කහල්ල රක්ෂිතයට ලැබෙන වර්ෂා ජලය හටන්ගම වැවට වැටී ඉන් පිලිවෙලින් තිබ්බොටුවාව, ගලහිටියාව හා අලවත්ත වැව, නිකවැව හා මහගල්ලාව වැව පෝෂණය කරමින් මී ඔයට ගලා බසී.එල්ලන්ගාව හෙක් 935.2ක් පමණ විශාලත්වයකින් යුක්ත වන අතර සලියගම හා මඩගල්ල නිකවැව හා ගලහිටියාව යන ග්‍රාම නිලධාරී වසම් වල ව්‍යාප්තවී ඇත.100% ක්ම පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය තුල පිහිටා ඇත.වී වගාවට ගැළපෙන සහ කුඩා කඳු වැටි වටාඑල්ලන්ගාවේවැව් පිහිටි තැනීම සඳහා ඉඩම් ඇති අඩු ග්රේඩියන්ට් බෑවුම් ප්‍රදේශ වේ. මෙම හුදකලා කඳු සහ පරාසයන්හි උන්නතාංශය මීටර් 100 සිට 630 දක්වා වෙනස් වේ. කරනම්පොත්ත කන්ද මීටර් 300 නොඉක්මවයි. ගලේන කන්දේ සහ ඔමාරගොල්ල කන්දේ උස පිළිවෙලින් මීටර් 630 ක් සහ මීටර් 590 ක් වේ. නාගල කන්ද, දෙගොඩතුර කන්ද, තලපත්වැව කන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ටෂයේපොල්පිතිගම යාපහුව ඓතිහාසික රාජධානිය, ඉහල ඕතොට, දිවිගඳහ කෝරළ දෙක සහ ගල්ගමුව මැතිවරණ කොට්ඨාශය පිහිටා ඇත. මෙම කොට්ඨාශය පහතරට වියළි කලාපය (DL1b), පහතරට අතරමැදි කලාපය (IL3) ලෙස විවිධ කෘෂි පාරිසරික කලාප තුනකින් සමන්විත වන අතර ඉතා කුඩා ප්රදේශයක් (මුළු භූමි ප්‍රමාණයෙන් 3%) මැදරට අතරමැදි කලාපයට (IM3b) අයත් වේ. සිංහල ජාතිකයන්ගෙන් යුත් මුළු ජනගහනය 1457 ක් පමණ වේ.

අමුණුකොලේ එල්ලංගාවේ වැව් ව්‍යාප්තිය

	වැවේ නම	අක්	ගොවින්
1	අමුනුකොලේගම වැව(නෙලුම් වැව)	40	45
2	අලුත් වැව	13 1/2	14
3	කුඹල් පොරුගම වැව	50	60
4	සියඹලාග මුල වැව	3	3
5	ගල්කන්දෙගම වැව (ඉහල වැව)	45	31
6	කෝන්ගහමූල වැව	8	6
7	ඉස්වෙටිය වැව	5	8
8	ඩෝසර් වැව	1	1
9	කුඩා වැව	19	24
10	පන්සල් වැව	2	1
11	කන්ද අද්දර වැව	2	2
12	මතඹලාවවැව	10	8
		198.5	203


Spill way
The Drainage pattern and the tanks of Amunukolegama Cascade in Polpithigama Hotspot
N
Tank
Tank bund
Spill way
06
03
04
02
01
10
09
05
KALINGUWA
11
TO AMUNUKOLE ELA
08
12
07
Conceptalized and Compiled by Nishan Sakalasooriya based on PRA Results done by Janathakshan, 2019/2020

අමුනුකොලේ එල්ලංගාව



Amunuhelegama Cascade in Polpithigama DSD
Landuse Types
1324
495
380
107
16
16
1400
1200
1000
800
600
400
200
0
ACRES
Scrub
Paddy
Home Garden
Tank
Coconut
Rock
LAND USE TYPES
Polpithigama DSD
Saliyagama
Madagalla
1:380,000
Matuluwawa Wewa
Saliyagama
Madagalla
Legend
Drianage
Foot Path
Main Road
Cart Road
GNDs
Coconut
Home Garden
Paddy
Rock
Scrub
Tank
0 0.25 0.5 1 Km
1:25,000
Data Source :- Department of Survey
Compiled By :- Mr. Sampath Arunashantha
(Sampathgeo@kln.ac.lk)
80°23'30"E
80°24'0"E
80°24'30"E
80°25'0"E
80°25'30"E
80°26'0"E
7°53'30"N
7°53'0"N
7°52'30"N
7°52'0"N
7°51'30"N
7°51'0"N
7°50'30"N
7°50'0"N

1.2 අමුනුකොලේගම එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙයේ මී ඔය ද්‍රොණියේ තුන්වන උපද්‍රොනියේ පිහිටා ඇති මෙම එල්ලංගාව අයත් පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති 11ක් හා වැව් අමුණු 488 පිහිටා ඇත. ප්‍රදේශය තුල වැව් හා අමුණු වල පැතිරිම අක්කර 87554 ක පැතිරීයයි .එමගින් කුඹුරු අක්කර 24893 ක්ද ඉන් එල්ලංගා පද්ධති 11කම දේශගුණ සුහුරු ව්‍යාපෘතියේ 11 අධියර යටතේ ප්‍රතිසංස්කරණය කිරිමට පියවර ගෙන ඇති අතර අමුනුකොලේගම එල්ලංගාවද ඉන් එකකි. මෙම එල්ලංගාව අවට පිහිටි එල්ලංගා ලෙස මකුල්ල ගහමුල්ල එල්ලංගාව(වැව් 04), පඩරුල් වැව එල්ලංගාව (වැව් 05) යන එල්ලංගා පිහිටා ඇත.

වගු අංක 01 - පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙය තුල පිහිටා ඇති එල්ලංගා පිලිබද තොරතුරු දක්වා ඇත .

අනු අංකය	එල්ලංගාවේ නම	අයත්වන වැව් සංඛ්‍යාව	ප්‍රතිසංස්කරණයකරන/නොකරන බව
01	අමුණුකොලේ වැව	12	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
02.	ගලගාව වැව	07	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
03	ගෙදර ගාව වැව	11	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
04	කුරුදු ගස් වැව	08	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
05	මකුල්ල ගහ මුල වැව	04	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
06	පඩරල් වැව	05	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
07	පොන්නිලව වැව	05	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
08	පොතුවැපිටිය වැව	04	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත

09	වැටිය වැව	11	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
10	මුදියන්නේගම	20	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත
11	තලාද පිටිය	22	ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇත

අමුනුකොලේගම එල්ලංගා පද්ධතියට වැව් 12 ක් ඇතුලත් වන අතර මෙම වැව් සුහුරු ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇත . මෙම එල්ලංගා පද්ධතිය පිහිටි ග්‍රාම නිළධාරි වසම හෙක්ටයාර් 562.9ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වි ඇති අතර එල්ලංගාවේ භූමි ප්‍රමාණය හෙ 935.2 පමණ වේ. පිහිටිම අනුව එල්ලංගාවේ පහල මුහුදු මට්ටමේ මිටර් 254 පමණ උසවන අතර එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මිටර් 340 ක් පමණ වේ. හුදකලා කදු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මිටර් 274 කට අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර අක්කර 19 කි. එල්ලංගා පද්ධතිය තුල කුඹුරු අක්කර 198 ක් ද ග්‍රාම නිළධාරි වසම තුල සම්පූර්ණ පෝෂක කුඹුරු ප්‍රමාණය අක්කර 416 ක් වේ. එල්ලංගා පද්ධතියට අයත් වැව් වල (ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇති) ජල පෝෂක ප්‍රදේශය ලෙස අක්කර 17 ක් හදුනා ගෙන ඇත.



අමුනුකොලේ එල්ලංගාව හා අවට පිහිටි වෙනත් එල්ලංගා

1.4. එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගු අංක 2

තොරතුරු	**විස්තරය**
දිස්ත්‍රික්කය	කුරුණෑගල
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	පොල්පිතිගම
මැතිවරණ බල ප්‍රදේශය	යාපහුව
ගංගා ද්‍රෝණියේ නම	මී ඔය ගංගා දෝණිය
එල්ලංගාවේ නම	මැඩිල්ල අමුණ
ගොවිජන සේවා බල ප්‍රදේශය	අමුණුකොලේගම
ග්‍රාම නිලධාරී වසම්	1
එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්:	935.2
ජලපෝශක ප්‍රදේශයේ නම	අමුණු කොලේගම
පැහැදිලි ජල පෝෂක සංඛ්‍යාව	03
කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරණ වැව් සංඛ්‍යාව	10
වනාන්තර ප්‍රදේශ	529.6
මුඩු බිම්	හෙක් 43 (හදුනාගත්)
එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව	184
ගෙවතු	හෙ 470
පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛා	09
පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛාව	12

1.5 අමුනුකොලේගම එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම

අමුනුකොලේගම එල්ලංගාව හෙක්ටයාර් 935.2කින් සමන්විත වැව් 12 කින් යුක්ත වේ . මෙම වැව් 12 ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇති අතර තවත් වැව් කිහිපයක් එල්ලංගාව තුල පැවතියද එම වැව් පිලිබඳව මෙතෙක් සලකාබලා නැත . මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර 455 ක් පමන වේ. මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් සංඛ්‍යාව 470ක් පමන වේ. මේ සමගම එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 1739ක් පමන වාසය කරයි . මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ කටයුතු වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වණ විනාශය අවිධමත් හේන් හා ගොඩ ඉඩම් වගාව නිසා සිදවන පාංශු ඛාදනය වැව් ඉස්මත්ත අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු වගා කිරීම වැනි ක්‍රියාකාරකම් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දීමට හේතවී ඇත. තවද ජනගහනය වර්ධනය හා ඉඩම් බෙදී යාමත් පවතින සම්පත් දිනෙන් දින වේගයෙන් භාවිතයට ගැනීමත් හිග වීමත් නිසා මෙම ප්‍රදේශවල වැව් ජලය සීඝ්‍රයෙන් සිඳී යාමේ තර්ජනයකට මුහුණ දෙමින් සිටී. වසර ගණනක දේශගුණ දත්තයන් සලක බලන විට ජල මාර්ග සිඳී යමින් දේශගුණික විපර්යාශයන් අනුව මෙම තත්වය තව දුරටත් වෙමින් පවතී. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුණරුත්ථාපනය පමනක් කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර ලෙස සංවර්ධනයට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර අමුනුකොලේගම එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය මෙම එල්ලංගාව වෙත යොමු වී ඇත. එහිදී එල්ලංගා කලමනාකරණ කමිටුව මගින් එල්ලංගා පැතිකඩක් හා එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර ඒ මගින්එල්ලංගාව සංවර්ධනය කිරීමට සැලසුම්කර ඇත . ඒ අනුව එල්ලංගාවේ පහත අත්‍යාවශ්‍ය අංගෝපංග ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුවේ . එහි දී අනුගමනය කලයුතු ප්‍රධාන දස වැදැරුම් ක්‍රියාමාර්ග මෙසේය.

I. 1 වැවේ පෝෂිත ප්‍රදේශය සංවර්ධනය. මේ යටතේ ප්‍රමාණවත් වෘක්ෂලතා ආවරණයක් පිහිටුවීම හා පවතින වෘක්ෂලතා කලාපය ආරක්ෂා නිරීම.
II. වැව් ඉස්මත්තේ සිදුකෙරෙනඅණවසර වගාවන් නිසා සිදුවන ප්‍රබල පාංශු ඛාදනය අවම කිරීමට පියවර ගැනීම.
III. මෙහිදී වැව තුල අණවසරයෙන් කුඹුරු වගා කරන ගොවීන් ඉවත් කිරීම.
IV. වැව ඉස්මත්තේ හේන් වගා බිම් සඳහා පාංශු සංරක්ෂණ වැටි දැමීම.
V. වැව වටා ශක්තිමත් පෙරණයක් (Filter) යෙදීම .
VI. පවතින ගොඩ වල පුණරුත්ථාපනය හෝ අවශ්‍ය ස්ථාන වල ආරක්ෂිත වැටි මගින් වැවට ගලා එන ජලය මගින් ගෙන එන දෑ අවම කිරීම. (වැව ගොඩවීමට බලපාන රොන් මඩ, වැලි සහ මැටි , ශාඛ හා සත්ව කොටස්)
VII. වැවේ කට්ට කඩුව, ගස්ගොම්මන, ඉස් වැටිය යන අංගයන් නැවත හැකිපමණින් නැවත පිහිටුවීම.
VIII. වැවේ හා වාරිමාර්ග පද්ධතියේ නඩත්තුව විධිමත් පරිදි පවත්වාගෙන යාම.
IX. වැවේ රාජකාරී සම්බන්ධයෙන් පැරණි සිරිත් විරිත් නීති රීති අනුගමනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට ගොවි සංවිධාන යොමුකිරීම.
X. ඉහත කරුණු පිළිබඳව ගොවි සංවිධාන ගොවීන්ට පුළුල් දැනුමක් ලබාදීම.

මීට අමතරව එල්ලංගා කළමනාකරණ කමිටුව (CMC) මගින් නිරන්තරයෙන් එල්ලංගාව අධීක්ෂණය කරමින් තත්වය කළමනාකරණය කිරීම හා අදාල වගකිවයුතු ආයතන වල ප්‍රමාණවත් මැදිහත් වීම .

1.6 එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම්,"එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.

එල්ලංගාවක ආකෘතියක්

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණය එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත.එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම,නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 චක්‍ර ලේඛයට අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටු වීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය මේ වන විට දියත් කර ඇත .



එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම්

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.
- ගොවි සංවිධානහා ප්‍රජා මූල සංවිධාන.
- ජල සම්පත් මණ්ඩලය.
- ආපදා කලමණාකරන කාර්යාංශය.
- පොලිස් දෙපාර්තමේන්තුව.

- ජාතික/ පළාත් ජලජ ජීවී සංවර්ධන අධිකාරිය,
- පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය.
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව.
- අවශ්‍යතාවය අනුව වෙනත් දෙපාර්තමේන්තු ආයතන (ප්‍රාදේශීය ලේකම්ගේ තීරණය අනුව .
- පළාත්පාලන ආයතන .

එල්ලංගා කලමණාකරන කමිටුවේ සභාපතිත්වය ප්‍රාදේශීය ලේකම් විසින් දරනු ලබන අතර ලේකම් ධුරය දරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය නිලධාරී විසිනි . ඉහත ආයතන වල ප්‍රදේශීය මට්ටමේ නිළධාරීනගේ සහභාගිත්වයෙන් මාස දෙකකට වරක් මෙම රැස්වීම පැවැත්වීමට නියමිතය.

එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි.රාජ්‍ය ආයතන,පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.

ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන මගින්ද දක්වා ඇත.

1.7 එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහ වැලි ව්‍යාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී . මෙම වැඩ සටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදනම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් (ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩ සටහන) වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි . මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන (ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණවැඩ සටහන) තුලින්ය . මෙම ගොවි ජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ . මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි . ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි . මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.8 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්,සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ග්‍රාමීය සමාජය සංකීරණ වීමත් ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වි. එල්ලංගා පද්ධතිය වේගයෙන් හායනයට පත්වන්නට විය. වර්තමානය වන විට එහි ඉතාමත් වැදගත් අන්ගෝපාංගයන් වේගයෙන් හායනයට ලක් වී ඇත. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ.මේ සඳහා එල්ලංගාවේ.

භූගෝලීය ගැටළු

ජල විද්‍යාත්මක ගැටළු

පරිසර විද්‍යාත්මක ගැටළු

සමාජ ආර්ථික ගැටළු හා එල්ලංගාවේ පවතින තත්වය පිළිබඳව හඳුනා ගත යුතුවේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා,ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ගත යුතුය .මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසරව පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමනාකරණ වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ

කලමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක,ජල විද්‍යාත්මක,පරිසර විද්‍යාත්මක,බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවක රුවන් දැනුවත් කිරීම.

1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හායනයට පත්වී ඇති ආකාරය, එහිදී පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදිව දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ.එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

2 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

අමුනුකොලේගම එල්ගංගාව පැතිකඩක් සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගවනය කරනු ලැබීය

එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒතුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය . එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ චාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝ ජිතයන් සමග එල්ලංගා හරස්කඩ චාරිකාව සැලසුම් කරන ලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024.08.22 දිනයයි. මෙම චාරිකාව කණ්ඩායම් 5 කින් යුක්ත විය. එල්ලංගාවේ හරස්කඩ චාරිකාව සැලසුම් කරණ ලද්දේ සරළ රේඛාවක් හරහා ගමන් කිරීමෙන් නොව බහු අශ්‍රයක් තුල (Polygon) නිරීක්ෂණය කිරීමයි. වඩාත් ගුනාත්මක දත්ත සපයාගැනීමේ අපේක්ෂාවෙන් හා එම දත්ත යොදාගෙන ගුණාත්මක වාර්ථාවක් ලබා ගැනීම මෙහි අරමුණ විය. මේ සඳහා

දත්ත සටහන් කරගැනීමට හැකියාව ඇති නිලධාරියකු ව්‍යාපෘතිය මගින් යොදා ගත් අතර මග පෙන්වීම සඳහා ගොවි සංවිධාන නියෝජිතයන් හා ගෙවි ජන සංවර්ධන නිලධාරීන් කෘෂිකර්ම නිශ්පාදන සහකාර හා ග්‍රාම නිළධාරීන් මේ සඳහා සහභාගීවූ සෙසු නිලධාරීන් වූහ.

කණ්ඩායමේ ක්සේත්‍ර වැඩසටහන

කණ්ඩායම 05ක් මෙම චාරිකාවට සහබාගී විය. සැළසුම් කල බහු අශ්‍ර (Polygon) අනුව ක්ෂේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙම කණ්ඩායම් යොදාගන්නා ලදී. මෙම සැලැස්ම අනුව අමුනුකොලේගම එල්ලංගාව පද්ධති සමස්ථ චාරිකාව කිලෝ මීටර් 2කින් පමණ යුක්ත විය . මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමණාකරණ කමිටු සාමාජිකයින්ට ඉදිරිපත් කර එම දත්ත වල නිවැදිතාවය තහවරු කර ගැනීමට අවශ්‍යවිය. ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක , ජල විද්‍යාත්මක , පරිසර විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩ මුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තව දුරටත් තහවුරු කරගනු ලැබීය. විශේෂයෙන්ම මෙම තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වේ. තවද එල්ලංගාව පිළිබඳව අධ්‍යනය කරනු ලබන ආයතන හෝ ව්‍යාපෘති වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධනය සැලසුම් කිරීමේදී මෙම තොරතුරු බෙහෙවින් ඉවහල් වනු ඇත.

3අමුනුකොලේගම එල්ළංගාවඑල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, අමුනුකොලේගම එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය.මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවට ද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම .

(ii) ද්විතීය දත්ත එකතු කිරීම .

(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම .

(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම.

(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම.

(vi) එල්ලංගා පැතිකඩ සැකසීම. ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම,යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම.

(viii) එල්ලංගා සැලැස්ම සැකසීම.

(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම.

එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දළ ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term),මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු, එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කලමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත .

3.1 තොරතුරු කළමනාකරණය සැලැස්ම සැකසීම.

එල්ලංගා ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීමට
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව / බහුඅග්‍ර අධීක්ෂණය වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම

(x) එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ග කාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්ම සකස් කර ඇත.

3. 2 අමුනුකොලේගම එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

අමුනුකොලේගම එල්ලංගාව එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කලමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කලමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කලමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ.ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම,දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම,එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කලමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශිලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවා නම් 1. භූගෝල විද්‍යාත්මක 2. භූ විද්‍යාත්මක 3. ජල විද්‍යාත්මක 4. පාරිසරික විද්‍යාත්මක 5. මානව හැසිරීම් 6. සමාජ ආර්ථික 7. කෘෂිකාර්මික 8. වාරිමාර්ග කලමණාකරන 9. පෝෂිත ප්‍රදේශයේ තත්වය යන ආදියයි.මේවා එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත.මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලාංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

4 අමුනුකොලේගම එල්ගංගාව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

4.1 භූගෝලීය (Geographical) තොරතුරු

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කුඩා කඳු වැටි වලින් වටවූ එල්ලංගා වලින් යුක්ත වේ . අඩ බෑවුම් ප්‍රරදේශ හරහා ඉඩම් ව්‍යාප්තව පවතී. වී වගාවට මෙන්ම ගොඩ බෝග වගාවට ගැළපෙන භූමි පද්ධතියක් මෙම කඳු වැටි අතර පිහිටා ඇත. හුදකලා කඳු සහ පරාසයන්හි උන්නතාංශය මීටර් 100 සිට 630 දක්වා වෙනස් වේ. කරණම්පොත්ත කන්ද මීටර් 300 නොඉක්මවයි. ගල්ලෙන කන්දේ සහ ඔමාරගොල්ල කන්දේ උස පිළිවෙලින් මීටර් 630 ක් සහ මීටර් 590 ක් වේ. තවද දෙගොඩතුරාව කන්ද, තලපත්වැව කන්ද යන කඳු පොපිතිගම හා ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පිහිටයි . අමුනුකොලේගම එල්ලංගාව කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව මැතිවරණ කොට්ඨාශයේ පිහිටි පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් භූමි ප්‍රදේශය තුල පිහිටා ඇත. පොල්පිතිගම එහි ප්‍රධාන නගරය ලෙස සැලකේ. කුරුණෑගල සිට ඉබ්බාගමුව කුඹුක්ගැටේ හරහා පොල්පිතිගම ඔස්සේ මඩගල්ල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල සිට කිලෝමීටර් 65 ක පමණ දුරින් අමුනුකොලේගම එල්ලංගාවඇත .

ඉතා දර්ශනීය කඳු වැටි කිහිපයකින් වටවූ ඉතා දර්ශනීය වූ භූමියක පිහිටි මෙම එල්ලංගාව වැව් 12ක් ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන පුනරුත්ථාපනය කර ඇත. එහෙත් එල්ලන්ගාව තුල තවත් වැව් 34ක් පමණ පිහිට තිබේ . එල්ලන්ගාව හෙක් 935.2ක් පමණ විශාලත්වයකින් යුක්ත වන අතර සලියගම හා මඩගල්ල ග්‍රාම නිලධාරී වසම් වල ව්‍යාප්තවී ඇත.100% ක්ම පොල්පිතිගමප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වී වගාවට යෝග්‍යවූ ඉඩම් පද්දතියකින් යුක්ත වූ කලාපයකි.

එල්ලංගාව වැව් පිහිටීම පිළිබඳව දළ සටහනක් මෙහි දක්වා ඇත. මෙම සටහනට අනුව අමුනුකොලේගම වැව දක්වා එකිනෙකට සමාන්තර පද්ධති දෙකක් ඔස්සේ ජලය ගලා එයි. එක් පද්දතියක වැව් 03 ක් පිහිටා ඇති අතර අනෙක් පද්දතිය වැව් 6 කින් යුත්තතරමක් සංකීරණ පද්දතියකි. මෙම පද්දතියෙන් වැඩි ජල ධාරිතාවයකින් එල්ලංගාව පෝෂණය වේ. තව ද හුදකලා වූ වැව් 2 දක්නට ඇත. 10 11 12 යන වැව් එකිනෙකට ලංව පිහිටා අංක 11 වන අමුනුකොලේගම වැව පෝෂණය කරයි.මෙම සටහන අනුව අංක 03 ඩෝසර් වැව ලෙසත් අංක 4 කොන්ගහමූල වැව වන අතර අංක 01න් සියඹලාගහමූල වැව පිහිටා ඉස්වැටිය වැව අංක 5හි පෙන්වයි අංක 09 හා 08 පිළිවෙලින් මතම්බලව හා ගල්කන්දේ ගම වැව් සලකාඅ ඇත.



Conceptualized and Compiled by Nishan Sakalasooriya based on PRA Results done by Janathakshan, 2019/2020

4.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාව හෙක්ටයාර් **935.2**කින් යුක්තය. මෙය ඉතා කුඩා වැව් 12කින් යුත් එල්ලංගාවකි . ජනාවාස අතර ලඳු කැලෑව මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කුඩා කඳු වැටි වලින් වටවූ එල්ලංගා වලින් යුක්ත වේ. අඩ බෑවුම් ප්‍රදේශ හරහා ඉඩම් ව්‍යාප්තව පවතී. වී වගාවට මෙන්ම ගොඩ බෝග වගාවට ගැළපෙන භූමි පද්දතියක් මෙම කඳු වැටි අතර පිහිටා ඇත. හුදකලා කඳු සහ පරාසයන්හි උන්නතාංශය මීටර් 100 සිට 630 දක්වා වෙනස් වේ.

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමි සාමාන්‍යයෙන් මෘදු බෑවුමක් හා රැලි සහිත තැනිතලාවකි. ජලාපවහාන රටාව ප්‍රධාන වශයෙන් මීඔය ගංගා ද්‍රෝණියේ හා සම්බන්ධවන අතර එය අමුනුකොලේ ඇල ප්‍රධාන ජල මූලාශ්‍රය වේ. ප්‍රදේශයට නැගෙනහිර දෙසට පතිත වන වැසි ජලය බස්නාහිර

ප්‍රදේශයට ගලා බසින අතර එය මී ඔයට එකතුවේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජලමාර්ග බොහෝ ස්ථානවල අවහිර කර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් හා අමුණු රාශියක් ඉදිකර ඇත. වැසි සමයේදී, ජලය වේගයෙන් ගලා යාම නිසා දැඩි පාංශු ඛාදනයක් සිදුවේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඇති කුඩා වැව් වලින් 12ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කර ඇත . වියළි කාලවල දී භූගත ජල මට්ටම අඩි25ක් පමණ ගැඹුරට පහල බසින අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබාගනී. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීණ ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු කාලයකින් එල්ලංගාව සිදීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතා කෙටි වන්නේ වැව් ඉස්මත්තේ නිසි පෝෂිත ප්‍රදේශයක් නොමැති හා දූර්වල නිසාය .කඳු වැටි වලින් වටවූ කලාපයක් වීම නිසා පාංශු ඛාදනය ඉතා වේගවත් වන්නේ ජලයේ ප්‍රවේගය නිසාය.මේ නිසා වැව් ගොඩ වීමද සීග්‍රයෙන් සිදුවේ. එල්ලංගාවේ අවසන් ජලාශය වන්නේ අමුනුකොලේගම වැවයි. මෙම වැවේ හරි මැදින් පාරක් දමා අත්තේ ඉතා මෑත කාලයේදීය.මේ නිසා වැව දෙකඩ වී ඇත. වැවෙන් 1/3 පමණ පාර නිසා වෙන් වී ඇත . මෙම කලාපය අනවසර අල්ලා ගැනීම් බහුල වී ඇති බව පෙනේ. තවද අමුනුකොලේගම වැව ඉස්මත්ත අක්කර 12 ක් පමණ අනවසරයෙන් අල්ලාගෙන ඇති බව පෙනේ. අනවසරයෙන් අල්ලාගෙන සිටි ගොවියකු වගා කල අක්කරයක පමණ කුඹුරු ඉඩම ගොවි සංවිධානය විසින් තහනම් කර ඇත. වැවේ ඉස්මත්ත සීමාවන් පැහැදිලි නොවන්නේ වැව මැදින් දමා අතිපාර නිසාය. වැව හා ඉස්මත්ත ජලජ ශාඛ වලින් ගහනය.

4 .3 පරිසර විද්‍යාත්මක (Environmental)

තොරතුරුඅමුණුකොලේගම එල්ලංගාව

මෙම එල්ලංගාව තුල වැව් 12 ක් පවතින අතර මෙම වැව් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. අඩ තැනි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත බෙහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලේ පිහිටි කුඹුරු යායෙනි. මෙම වැව් තාවුල්ල හා බැඳුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත. වාර්ෂිකව වැව් ඉස්මත්තෙ කුඹුරු වගාව නිසා සේදී පහලින් පිහිටි වැවට එකතු වන රොන්මඩ හා පස් අංශු අති විශාලය. මෙය වාර්ෂිකව සිදුවේ. මෙහි ඉස්වැටිය පෙරණය ගොඩවල නැත . වැව් ඉස්මත්ත මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වී ඇත. වැව ඇතුලත පැහැදිලිව අනවසර කුඹුරු දක්නට ලැබේ මෙම අනවසර

ඉඩම් වලට තාවකාලික අනවවයර බලපත්‍ර හෝ ඔප්පු නිතුත්කර ඇත. වැව ඉස්මත්ත පදිංචිය සඳහා

භාවිතා කිරීමත් නොයෙකුත් අක්‍රමිකතා සඳහා පාවිච්චි කරමින් වැව ගොඩකරන ගොවීන් ඇත. මෙම තොරතුරු පරීක්ෂාවේදී හා ක්ෂේත්‍ර පරීක්ෂාවලදී දක්නට හා සහභාගී වූ ගොවීන්ගෙන් ලැබුණු තොරතුරු අනුව වැව් ඉස්මත්තේ වන වැව තුලට පැමින අක්කර ගනන් අල්ලාගෙන වගා කරන අනවසර කරුවන් සංවිධානාත්මකව හා උපායශීලීව වාන පහත් කර වැව් තුල ඇති කුඹුරු ඉඩම් වල වී වගාව බේරා ගැනීමට කටයුතු කර ඇත.

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මෙම වැව් පද්ධති පුණරුත්ථාපනය කලද වර්ථමානය වන විට වැව් හා අදාල පද්ධතිය සම්පර්ණයෙන්ම වල් බිහිවී ඇත. ඊට අදාල වැව් මානා ඉලුක් හා වෙනත් කැලෑවට යට වී ඇත. මුලු පරිසර පද්ධතියම මේ නිසා වල් බිහිවී ඇත. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්තු කරගැනීමට ගොවි සංවිධානවලට අවශ්‍යතාවයක් හෝ හැකියාවක් නොමැති බව මෙයින් පෙනේ. විශාල වියදමක් දරමින් කර ඇති අලුත්වැඩියාවන් ඉතා කෙටි කලකින් විනාශ වී යාහැකිය.

ගම තුළ නිරන්තරයෙන් නිවාස ඉදිවෙමින් පවතී . වෘක්ෂලතා ආවරණය පවතින්නේ 10% පමණ වේ. වන සංරක්ණ දෙපාර්තමේන්තුවට අයත් වන සංරක්ෂණ කලාප සුලු වශයෙන් ඇත. මෙම එල්ලංගාව තුල මීට වසර 03 කට පෙර පැවති මුලු ජනගහනය 927ක් පමණ විය. ක්‍රමයෙන් සිදු වන මෙම ජනගහන වර්ධනයත් සමග එල්ලංගාව තුල තව තවත් වෙනස් භූමි දර්ශනයන් ඇති විය හැකිය. බොහෝ ඉඩම් එලිපෙහෙලි කිරීමත් සමග අමුනුකොලේ එල්ලංගාව අක්‍රීය වනු ඇත මෙම තත්වය පාලනය කර ගැනීමට එල්ලංගා කළමනාකරණ කමිටුවටත් ගොවීන් හා අකනෙකුත් ප්‍රතිලාබීන්ගේත් සහයෝගය අත්‍යාවශ්‍ය වේ. සතුන්ගෙන් සිදුවන හානිය (රිළවුන් අලින් මොණරුන් හා ඌරන්) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂලතා සිටුවීම සම්බන්ධයෙන් දක්වන්නේ අකමැත්තකි. රිළවුන් මොණරුන් හා අලින්ගේ ගැවසීම නිසා ගස් හා පදුරු කපා දැමීමට ගොවීන් පෙලඹී ඇත. ඌරන් හා මුවන් දඩයම් කිරීම ද දැකිය හැකිය. ගොවිපළ වටා දැල් එලීම ආරක්ෂක වැට යෙදීමට ගොවීන් පෙළඹී ඇත.

එල්ලංගාව තුල කොහොඹ, මාදං, මාර, පලු, වීර, කුඹුක්, බක්මී වැනි වෘක්ෂ ලතා බහුලව දැකිය හැකිය .

4.4එල්ලංගාවේ පවතින ඉදිකිරීම් අමුණුකොලේගම එල්ලංගාව

එල්ලංගාව මුලුමනින්ම පාහේ ජනාවාස වලින් යුක්තවන හෙයින් නිරන්තරයෙන් නිවාස ඉදිකරමින් හා

වැඩිදියුණු කිරීම් පවතී. තවද ඉඩම් කැබලි වීමද වේගවත්ය. ගොඩ ඉඩම්වල සිදුවන පාංශු තට්ටුව කැපීම ළිං කැපී මහා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ හා හදිසියේ ඇතිවන සංවහන වර්ෂාව සිදුවන අවස්ථාවලදී වේගවත්ව ජලය ගලායාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශුකොටස් වැව්වල තැම්පත් වීම වැලැක්විය නොහැකිය. අවිධිමත් වගා බිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරකෂණ ක්‍රම අනුගමනය කල යුතුය.

4 .5 අමුණුකොලේගම එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය.

එල්ලංගා පද්ධතිය තුල පිහිටි මුලු වැව් සංඛ්‍යාව 12 කි. මෙම වැව් වල පුනරුත්ථපන කටයුතු 90% අවසන්ය. මින් වැව් 04ක් අතීතයේ ඔලගම් වැව් වශයෙන්. පවතින්නට ඇති බවට හඳුනාගත හැකි ය. මෙම වැව් යටතේ ඇති කුඹුරු අක් 01 සිට අක් 50 දක්වා පරාසයක් පුරා පවතී යි. කුඹල් පොරුගම වැව යටතේ අක්කර 50ක් කුඹුරු වගා කරයි. ඉහත වගු සටහන අනුව පිළිවෙලින් ගල්කන්දෙගම, අමුණුකොලේගම, අලුත් වැවැ අක්කර 45,40,13ක් ලෙස කුඹුරු වගා කරන අතර ඩෝසර් වැව පන්සල් වැව, කන්ද අද්දර වැව, පන්සල්වැව, සියඹලා ගහමුල වැව යන වැව් පිලිවෙලින් අක්කර 01, 02 ,03 වශයෙන් කුඹුරු වගාකරයි. එහෙත් එල්ලංගාවේ ජලය අවසාන වශයෙන් ගලා යන්නේ අමුණුකොලේගම වැවටයි. එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් වල ඉතා සුළු ගොවීන් සංඛ්‍යාවක් සිටීම විශේෂත්වයකි. වැව් 04ක හැර සෙසු වැවු වල සැලකිය යුතු ගොවීන් සංඛ්‍යාවක් ඇත . මෙම වැව් වල නඩත්තු ව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. ඇලවේලි හා වැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව යටතේ වගා කන්නයට පමනක් නඩත්තු කිරීමයි. එක් ගොවි සංවිධානයකට වැව් කිහිපයක් කළමනාකරණය කිරීමට සිදුවී ඇත. මෙම තත්වයනඩත්තුව දුර්වල වීමට හේතුවේ. ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතුරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජවම බලපාන ලබයි. තවද රක්ෂිත හා අනවසර ගොවීන් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා සහභාගී නොවේ. වැව් තාවලු වගාව ආරක්ෂා ගැනීමට වැවේ ජලය අනවසරයෙන් මුදාහැරීමට අනවසරකරුවන් කටයුතු කිරීම ප්‍රබල ගැටලුවකි . වැව් වල සොරොව්, ඇලවල්, යවාන වැනි අංගෝපාංග වලට හානි කිරීම ද දැකිය හැකිය. (එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින්යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්තිර බෝග වගාවන්ගෙන් ව්‍යාපත වී ඇත බෙහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැඳුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත.) ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේ දීය. ඇතැම් ජලපාලකයන් එක දිගට ම වසර ගණනාවක් කටයුතු කරන බව පෙනේ.ගොවිසංවිදන රැස්වීම් වල සනපුරණය පිලිබඳව බරපතල ගැටලු පවතී. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන බව වාර්තා වුවත් ගොවීන්ගේ අදහස් ඊට පටහැනිය. නඩත්තුව ගොවීන් වෙත පංගු

ලැස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් හෝ ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිලිබඳව වගකීමක් නොගැනීමට හේතුවේ. වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්බ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වී වගා කෙරේ. ඇතැම් වැව් හා කන්න වල බෙත්ම වගාකෙරේ.මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබඳව දූර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහභාගිත්වයේ විශේෂ දූර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක් නොපෙනේ. තවද ගොවි සංවිධාන වසර 35කට වැඩි ඉතිහාසයක් පැවතියද අරමුදල් වර්ධනය වීමක් නැත. සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය. නිලධාරීන්ගේ හිගකම හෝ නොසැලකිල්ලද මෙයට හේතු වේ .වාරිමාර්ග කළමනාකරණය හා නඩත්තු සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිලිබඳව ගොවි සංවිදානයට පුහුණුවක් ලබාදිය යුතුවේ.

3.3.8. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

වයඹ පළාතේ සංවර්ධිත ග්‍රාමීය ප්‍රදේශයක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රරදේශය. කෘෂිකර්මාන්තයේ යෙදෙති. අපගේ නිරීක්ෂණයේදී, මෙම ජනාවාස වලට රජවරුන්ගේ කාල පරිච්ඡේදයේ සිට එන ඉතා දිගු ඉතිහාසයක් ඇත. කෘෂිකර්මාන්තය ප්‍රධාන වශයෙන් වගා ප්‍රදේශවල කේන්ද්‍ර වන්නේ වී වගාව වන අතර බොහෝ දුරට මහා කන්නයට පමණක් සීමා වේ. එල්ලංගාවේ වැව් පද්ධති වල පවතින මෙම කුඹුරු වලින් බහුතරයක්වාරි ජල සැපයුමෙන්වගා කරයි . තරුණ තරුණියන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඌන රැකියා හෝ රැකියා විරහිතව සිටින්නේ සුදුසු අවස්ථා නොමැතිකම හේතුවෙනි. දේශගුණිකසුහුරු වාරි කෘෂිකාර්මික ක්‍රම භාවිතයන් සමඟ හා එල්ලංගා පද්ධතිය නවීකරණය කිරීම නිසි පරිදි ඔවුන් අවබෝධකරගත හොත් විරැකියාව අඩු කිරීමට සහ පවුලේ ආදායම වැඩි කිරීමට හේතු විය හැක. අනෙක් අතට, දේශගුණය හා සම්බන්ධ අවදානම් අඩු කරන අතරම උණුසුම් කලාපවල කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමට එය සහාය වනු ඇත.

ප්‍රද්ශයේ කෘෂිකාර්මික බෝග රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙන වී වගා කරන අතර යල කන්නය වැව් හා කෘෂි ළිංවල ජලය යොදාගනිමින් වී හා අතිරේක අහාර බෝග වර්ග වගා කරයි ඉස්වැටිය , මහතඹලාව යන වැව් ආශ්‍රිතව හේන් වගාවද සුළු වශයෙන් සිදු කරයි. නමුත් යල කන්නයේ දී මහකන්නයේදී අමුණුකොලේගම එල්ලංගාවේ සමස්ත වී වගාව අක්කර 245 ක් පමණ වේ පහත වගු සටහනින් වගා රටාව පිළිබඳව දළ විග්‍රහයක් දක්වා ඇත. මේ අනුව යල් කන්නයේ සාමාන්‍ය වර්ෂාපතනය ට අනුව තිරේක අහාර බෝග වගාව අක්කර 45 පමණ වේ. මහා කන්නයේ 205 වන වී වගාව යල කන්නයේදී අක්කර 32ක් පමණ වේ . වෙනත් අතිරේක බෝග වගාව අක්කර 13 කට වැඩි නොවේ .දැඩි වියලි කාලයේදී මහ කන්නයට මුළු වගාව අක්කර 40 වන අතර එය වී වගාවට සීමාවී ඇත. මේ අනුවඑල්ලංගාවේ කෘෂි කාර්මික සංවර්ධනයේ දැඩි පසු බෑමක් මින් පෙන්නුම් කෙරේ . වැව් යටතේ වෙනත් අහාර බෝග වගාවට ගොවීන් උනන්දු කර නොමැති බව කිවයුතුය .ඉපනැල්ලේ වගාව කුඹුරු වල වෙනත් කෙටිකාලීන ආහාර බෝගවගා හෝ නව කෘෂි තාක්ෂනය හඳුන්වාදිය යුතුවේ . මෙම නව කෘෂි දැනුම තරුණ ප්‍රජාව ඉලක්ක කර සංවිධානාත්මකව ආරම්භ වෙළඳපොල ඉලක්ක කර ඇරඹිය යුතුය.දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ක්‍රම භාවිතයන් සමඟ ඉදිරි අනාගතයේදී නව දැනුම ප්‍රජාව අතරට හුවමාරු වෙනු ඇත. තවද ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති වගා ළිං නව ප්‍රවනතාවයට තවත් හේතු වියහැකිය.

එල්ලංගාවේ සත්ව පාලනය සැලකියයුතු තත්වයක පවතී .ඒක පුද්ගල ආදායම වර්ධනයට මෙම කර්මාන්තය පහසුවෙන් යොදාගත හැක.

පොල්පිතිගම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ පැතිකඩ මෙහි වර්තමාන කෘෂිකාර්මික තත්ත්වය, කන්නය අනුව බෝග රටාව, බෝග, කන්නය සහ මූලාශ්‍ර අනුව වාරි මාර්ග රටාව විස්තර කෙරේ. ප්‍රධාන භෝග නිෂ්පාදනය සහ ඵලදායිතාව, ආහාර සැපයුම, පශු සම්පත් සහ මත්ස්‍ය නිෂ්පාදනය සත්‍ව පුරුෂ භාවය අනුව සහ ඒවායේ පෝෂණ ඇඟවුම් පැහැදිලි කර ඇත. තවද ගොවිජන සේවා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් තාවකාලික ප්‍රවණතා සහ කලාපීය රටාව විස්තර කර ඇත.

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල යනු කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශාලතම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය වුවද, එහි ඒක පුද්ගල ඉඩම් පරිභෝජනය හෙක්ටයාර 0.5ක් පමණි. ගල්ගමුව සහ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා 5 වන ස්ථානය සහ සංඛ්‍යා ලේඛන අනුව . ගිරිබාව, අඹන්පොල, ඇහැටුවැව සහ කොටවෙහෙර පිලිවෙලින් 0.6, 0.6, 0.7, 0.8 කි .(ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව).

වගුව 3.9 ඒක පුද්ගල ඉඩම් භාවිතය

එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව යල මහා හා වර්ෂාපතන රටාව අනුව

	අමුනුකොළගම එල්ලංගාව			
බෝග	සාමාන්‍ය වර්ෂාපතන වර්ෂ		වියළි වර්ෂ	
	යල(අක්කර)	මහා (අක්කර)	යල(අක්කර)	මහ(අක්කර)
වී	32	205	15	40
රට කජු	2.5	02	05	00
බඩ ඉරිඟු	0.5	00	00	00
කළු කවුපි	00	00	02	00

එළවළු	10.5	00	03	00
කොමඩු	00	00	02	00
එකතුව	45.5	207	27	40

එල්ලංගාවේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය (සෙන්ටග්‍රේඩ්)

මාසය	අවුරුද්ද				
	2014	2015	2016	2017	2018
ජනවාරි	26.4	26.6	27.4	26.1	26.2
පෙබරවාරි	27.5	27.1	28.4	26.9	28.2
මාර්තු	29.2	28.5	30.1	28.2	34.4
අප්‍රේල්	28.9	28.3	29.8	29.7	28.9
මැයි	28.7	28.7	28.3	29.1	27.9
ජූනි	28.6	28.4	28.2	28.4	28.0
ජූලි	28.3	28.8	28.4	28.9	28.1

අගෝස්තු	27.5	28.8	28.8	28.5	27.8
සැප්තැම්බ(ර්)	27.4	28.1	29	27.8	28.8
ඔක්තෝබ(ර්)	27.2	27.6	28.7	27.7	27.4
නොවැම්බ(ර්)	26.0	27.2	27	27.0	27.0
දෙසැම්බ(ර්)	25.7	28.9	27	26.7	26.4
මූලාශ්‍රය: සම්පත් පැතිකඩ 2019, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වල					

පොල්පිතිගම උණුසුම් කලාපයේ එල්ලංගා ප්‍රදේශ

ඉහත වගු සටහන අනුව එල්ලංගා ප්‍රදේශයේ උෂ්ණත්වය පිළිබඳව පවතින තත්වය පෙන්නුම් කරයි . වර්ෂ 2014 - 2018 දක්වා ප්‍රදේශයේ පැවති උෂ්ණත්වය වගු සටහනින් දක්වයි. 2018 මාර්තු , අප්‍රේල් මාස වල සෙන්ටිග්‍රේරේඩ් අංශක 34.4 දක්වා උපරිමයක අගයක් පෙන්නුම් කරයි. මේ සටහනට අනුවඑල්ලංගා ප්‍රදේශයේ ඉතා ඉහල අගයක උෂ්ණත්වයක් පවතින බව පෙනේ. හොඳින් අව් රශ්මිය ලබන කලාපයක් බව පැහැදිලිය.

හේන් වගාව සඳහා වනාන්තර එළිකිරීමත් පොල් හා කෙසෙල් වගාව සිදු කිරීමත් දක්නට ලැබෙන අතර ප්‍රදේශය තුල වඳුරු හා මොණර ගණත්වය ඉහළයාමත් අලින්ගේ තර්ජන ඉහළ යාමත් හේතුවෙන් බොහෝ ගොවීන් හේන් සහ ගොඩ ගොවිතැනෙන් ඉවත්වන බව ප්‍රදේශයේ ගොවීන් පෙන්වා දෙයි. ඒ හේතුවෙන් හේන් ගොවිතැන සඳහා එළිකර අතහැරදැමූ වනාන්තර කොටස් ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ.

4.1.එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

අමුණුකොලේගම එල්ලංගාව පිහිටා ඇත්තේ දුර්වල ජල වහනයක් සහිත පහතරට වියලි හා මැදරට කලාපය ට මායින් වන්නටය සාමාන්‍ය ජනගහනයක් පවතින මෙම ප්‍රදේශයේ ජනගහනයෙන් 50%ක් කාන්තා ජනගහනය වේ. මුළු ජනගහනයෙන් 21% පමණ වයස අවුරුදු 15 ට වඩා අඩු වන අතර වයස අවුරුදු 15-59 අතර වයස් බාණ්ඩය මුළු ජනගහනයෙන් 64% පමණ වේ. රැකියා නියුක්ත ජනගහනයෙන් 45%ක් පමණම කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනී. ඒ අනුව ප්‍රදාන මානව ක්‍රියාකාරකම් ලෙස ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක. නමුත් 2023 වසරේ සිට මේ දක්වා වැව් වල ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් ජල සැපයුම් දුර්වල වී ඇති

බැවින් බොහෝ ගොවීන්ට කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට හැකිවූයේ අඩුවෙනි. පෞද්ගලික හා තාවකාලික රැකියාවල (33%) නිරත වන බව නිරීක්ෂණය වේ. මුළු ජනගහනයෙන් 80% පමණ වයස අවුරුදු 20ට වඩා අඩු වන අතර ජනගහනයෙන් 80%පමණම කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනී. ඒ අනුව ප්‍රදාන මානව ක්‍රියාකාරකම් ලෙස ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක. හේන් වගාව සඳහා වනාන්තර එළිකිරීමත් පොල් හා කෙසෙල් වගාව සිදු කිරීමත් දක්නට ලැබෙන අතර මෙම කාලයේ දී ප්‍රද්ශය තුල සත්ව හානි ඉහළයාම හේතුවෙන් බොහෝ ගොවීන් හේන් වගාවෙන් සහ ගොඩ ගොවිතැනෙන් ඉවත්වන බව ප්‍රෙද්ශයේ ගොවීන් පෙන්වා දෙයි. ඒ හේතුවෙන් හේන් ගොවිතැන සඳහා එළිකර අතහැරදැමූ වනාන්තර කොටස් ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ.

එල්ලංගාව තුල ජීවත්වන ශ්‍රමිකයන් 10% පමණ කම්කරුවන් වශයෙන් ප්‍රදේශයේම හා ආසන්න උප නගරවල හා ගොවි බිම් කේන්ද්‍ර කොටගෙන සේවය කරයි. මීට අමතරව පොල්පිතිගම හා කුඹුක් ගැටේ ප්‍රදේශ වල පවතින ගොවිපලවල් හා මහා පරිමාණ පොල්වතු වල හා ඇගලුම් කර්මාන්ත ශාලාවල මෙම ප්‍රදේශයේ කම්කරුවන්ට රැකියා අවස්ථා ලැබී ඇත. තවද විශේෂයෙන් එලවලු හා පලතුරුතොග රැස් කරමින් මෙම නගරවලට අළවි කරන තොග වෙළෙන්දන් කිහිපදෙනෙකු ද එල්ලංගානව තුල ව්‍යාපාර කටයුතු වල නිරතව සිටී . ව්‍යාපාරික වශයෙන් වගාවන් පවත්වා ගනිමින් වගා කටයුතු වල යෙදෙන ගොවීන් ද සිටී .කාන්තා ප්‍රජාව කෘෂි කාර්මික කටයුතු වලට පූර්ණ සහාය ලබාදෙන අතර ඇතැම් කාන්තාවන් වගා කටයුතු මෙහෙයවමින් කුලී ශ්‍රමය යොදා ගනිමින් ව්‍යාපාරයක් වශයෙන් කෘෂි කාර්මික කටයුතු වල නිරත වෙමින් සිටී. මේ අනුව කෘෂි කාර්මික කටයුතු පදනම් කරගත් සමාජ ආර්ථික පසුබිමක් මෙම එල්ලංගාව තුල දක්නට ඇත.

මහව , ගල්ගමුව, පොල්පිතිගම උප නගර එල්ලංගාවට මද දුරකින් පිහිටීමත් , කුරුණෑගල නගරය කි මී . 65 ක් පමන දුරකින් පිහිටීමත්, ප්‍රවාහන පහසුකම් හා ප්‍රධාන මාර්ග පද්දතියේ පවතින හිතකර තත්වයත් , අගනුවර හා උතුරු හා නැගෙනහිර පළාත් දක්වා දිවෙන දුම්රිය මාර්ගය එල්ලංගාව මධ්‍යයෙන් පිහිටීමත් සුවිශේෂ පහසුවකි. මෙම තත්වය සමාජ ආර්ථික පහසුකම් වලට යහපත් බලපෑමක් ඇතිකරයි. යාපහුව ඓතිහාසික රාජධානිය ආසන්නයෙන් පිහිටීමත් තවත් සුවිශේෂී වූ තත්වයකි . මෙය විශ්ෂ සමාජ , ආර්ථික හා සංස්කෘතික බලපෑමකට හේතුවේ .

මීට අමතරව කුඩා ප්‍රමාණයේ ස්වයංරැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රදේශය පුරා ව්‍යාප්තව ජීවත්වන අතර නිමි ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, කළුගල් කැඩීම වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි. මහා පරිමාණ ව්‍යාපාර ලෙස සහල් නිෂ්පාදන ආයතනයක් ද ඒ අවට නිරීක්ෂනය විය.

04. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

අමුණුකොලේ එල්ලංගාවේ පැවති හරස්කඩ චාරිකාවේ දී මෙන්ම ගොවි සංවිධාන හා නිලධාරීන් සමග සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග ගැටළු පිළිබඳව අවධාරණය කරගත හැකිවිය. එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසු ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේ දී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකි විය. මෙසේ හඳුනාගත් ගැටලු ගොවින්ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත. තවද උපාය මාර්ගික මැදිහත්වීම් හා මැදිහත්විය යුතු ආයතන පිළිබඳව තක්සේරුවක් කර දළ ඇස්තමේන්තවක් සකස් කර කාල රාමුවක්ද අමුණා ඇත. මෙම වාර්ථාව එල්ලංගා කළමනාකරණ කමිටවට ඉදිරිපත් කර සාකච්ඡා කර ක්‍රියාවට නැංවිය යුතුය.

අමුණුකොලේගම එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ක්‍රියාත්මක සැලැස්මේ සංෂිප්ත වාර්තාව.

4.9 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම්	මැදිහත්විය යත ආයතන

1	කට්ටකඩුව හා පෙරහන නොමැත ඩෝසර් වැව , මතම්බලාව, ඉස්වැටිය , ඉහලවැව ,අමුනුකොලේ වැව	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හදුනා ගැනීම II. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම . III. කට්ට කඩුව නිරීක්ෂණය කර එකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ට කඩුව හා පෙරනය වෙන් කිරීම. IV. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සදහා පැල සිටුවීම .	1. CSIAP / (CMC) 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
2	වාවේ ජලයෙන් මාර්ගයයට වේ . කොස්ගහමුල වැව	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හදුනා ගැනීම II.තක්ෂේරු කිරීම III.තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම	1. CSIAP / (CMC) 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
3	සොරොව්වෙන් ජලය කාන්දුවීම ඉස්වැටිය වැව සියම්ලාගහමුල වැව	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හදුනා ගැනීම II. තක්ෂේරු කිරීම III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
4	වාන සහ සොරොව්ව කැඩී ඇත . ඩෝසර් වැවඉස්වැටියවැව ,ඉහලවැව ,අමුනුකොලේ වැව,අලුත් වැව .	I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හදුනා ගැනීම II. තක්ෂේරු කිරීම III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම	1. CSIAP / (CMC) 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
5	ඇලවල් කැඩී ඇත. කුඹුරු වලට ජලය ලබා ගත නොහැකිය. මතම්බලාවැව, ඉස්වැටිය ,ඉහලවැව ,සියම්ලාගහමුල වැව , ,කොස්ගහමුල වැව, ඩෝසර් වැව ,	I. CMCහිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හදුනා ගැනීම ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම . II. තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තුවක් ලබාගැනීම III. ප්‍රතිපාදන සපයා ගැනීම ගොවි සංවිධානය මගින් අලුවැඩියා කිරීම	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
6	වැව් වල මීරිදිය මත්ස්‍ය සම්පත නැත. අමුනුකොලේ වැව,අලුත් වැව කුඹල්රුපෝරුව වැව.	1. CMC හිදී සාකච්ජා කිරීම . සුදුසු වැව් තෝරා ගැනීමැ 2. මිරිදිය මත්ස්‍ය පැටවුන් මුදාහැරීම .	1.CSIAP / CMC 2.ගොවිජන සං දෙ 3. ජල: ජී :ව : සං: අධි 4. ගොවි සංවිධාන

7	ගොඩවල නැති නිසා වැව ගොඩවීම. අමුනුකොලේ වැව.	I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම II. ස්ථාන හදුනා ගැනීම. III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම . IV. ගොඩවල නඩත්තුව ගොවි සංවිධානයට පැවරී .	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන
8	වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම . අමුනුකොලේ වැව.	I CMC හිදී සාකච්ජා කිරීම හා ස්ථාන හදුනා ගැනීම . II තක්ෂේරු කිරීම III තාක්ෂණික උපදෙස් සැලසුම් කිරීම හා ඉදිකිරීම් ගොවි සංවිධානයට පැවරීම.	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. ගොවි සංවිධාන
9	වැව් වල රදාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත . වැව් වල රොන් මඩ පිරිලා සියලු වැව් .	I. CMC හිදී සාකච්ජා කිරීම II. සුදුසු වැව් තෝරා ගැනීම III. තාක්ෂණික උපදෙස් සැලසුම් කිරීම හා තක්ශේරු කිරීම IV. ඉදිකිරීම් ගොවි සංවිධානයට පැවරීම.	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. ජල: ජී :ව : සං: අධි 4. ගොවි සංවිධාන
10	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත . නඩත්තු ඉතා දුර්වලයි	I. CMC හිදී සාකච්ජා කිරීම II. ගොවි සං සමග සාකච්චා කිරීම III. නඩත්තු සැලැස්මක් සකස්කිරීම IV. අරමුදලක් ගොඩ නැගීම හා ක්‍රියාත්මක කිරීම	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. ගොවි සංවිධාන
11	අනවසරයෙන් වැව් රක්ෂිත අල්ලාගැනීම	I. CMCහිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හදුනා ගැනීම II. ගොවි සං සමග සාකච්චා කිරීම III. 1 අනවසරකරු ලේඛණයක් සකස්කිරීම. IV. ඉවත් කිරීමට දෙනුම්දීම හෝ නීතිමය පියවර ගැනීම .	1. CSIAP / CMC 2. ගොවිජන සං දෙ 3. පළාත් වාරි දෙ 4. ගොවි සංවිධාන

12			

වගු අංක 13 -යෝජිත උපායමාර්ගික සැලැස්ම දළ ඇස්තමේන්තුව කාල රාමුව- අමුණු කොලේ එල්ලංගාව

උග්‍ර ගැටළු හා විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික ක්‍රියාකාරකම්	දළ පිරි වැය (රු. මි)	කාලරාමුව 2025														ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය මැදිහත්වීම්	
		කෙටි කාලීන						මධ්‍යකාලීන				දිගුකාලීන				ප්‍රධාන	අනෙකුත්
1කට්ටකඩුව හා පෙරණය (Filter) නැත.	0.3								▬	▬						1 CSIAP / CMC 2 ගොවිජන සං දෙ 3 පළාත් වාරි දෙ 4ගොවි සංවිධාන	ගොවි සංවිධාන
2 වැවේ ජලයෙන් මාර්ගය යටවේ .	0.2										▬	▬	▬			1 CSIAP / (CMC) 2 ගොවිජන සං දෙ 3 පළාත් වාරි දෙ 4 ගොවි සංවිධාන	1 ගොවි සංවිධාන 2 CSIAP 3 ගොවිජන සං දෙ 4 පළාත් වාරිමාර්ග දෙ

3සොරොව්වෙන් ජලය කාන්දුවීම	0.3									—	—					1 ගොවි සංවිධාන 2 CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරිමාර්ග දෙ	1ගොවි සංවිධාන 2CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරි දෙ
4වාන සහ සොරෝව්ව කැඩී ඇත .	0.2						—	—								1CSIAP / (CMC) 2ගොවිජන සං දෙ 3පළාත් වාරි දෙ 4ගොවි සංවිධාන	1ගොවි සංවිධාන 2CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරිමාර්ග
5 ඇලවල් කැඩී ඇත කුඹුරු වලට ජලය ලබා ගත නොහැකිය.	0.5							—	—							1 CSIAP / CMC 2 ගොවිසං දෙ 3 පළාත් වාරි දෙ 4 ගොවි සංවිධාන	1ගොවි සංවිධාන 2CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරිම දෙ
6 වැව් වල මීරිදිය මත්ස්‍ය සම්පත නැත.	0.2							—	—							1CSIAP / CMC 2ගොවිජන සං දෙ 3ජල: ජී :ව : සං: අධි 4 ගොවි සංවිධාන	1ගොවි සංවිධාන 2CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරිමාර්ග දෙ

7. ගොඩවල නැති නිසා වැව ගොඩවීම.	0.2															1 CSIAP / CMC 2ගොවිජන සං දෙ 3පළාත් වාරි දෙ 4ගොවි සංවිධාන	1ගොවි සංවිධාන 2CSIAP 3ගොවිජන සං දෙ 4පළාත් වාරි දෙ
8 වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම	0.2															1 CSIAP / CMC 2 ගොවිජන සං දෙ 3 ජල: ජී :ව : සං: අධි 4 ගොවි සංවිධාන	1 ගොවි සංවිධාන 2 CSIAP 2 ගොවිජන සං දෙ 4 පළාත් වාරි දෙ
9 වැව් වල රදාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත . වැව් වල රොන් මඩ පිරිලා	0.7															1 CSIAP / CMC 2 ගොවිජන සං දෙ 3 ජල: ජී :ව : සං: අධි 4 ගොවි සංවිධාන	1 ගොවි සංවිධාන 2 CSIAP 3ගොවිජන සං දෙ 4 පළාත් වාරි දෙ
10 වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත . නඩත්තු ඉතා දුර්වලයි	0.15															1 CSIAP / CMC 2 ගොවිජන සං දෙ 3 ජල: ජී :ව : සං: අධි 4 ගොවි සංවිධාන	1 ගොවි සංවිධාන 2 CSIAP 3ගොවිජන සං දෙ 4 පළාත් වාරි දෙ
11 අනවසරයෙන් වැව් රක්ෂිත අල්ලාගැනීම	0.2															1ප්‍රදේ: ලේ 2 ගොවිජන සං දෙ 3 පොලිසිය 3 ගොවි සංවිධාන	1 CSIAP / CMC 2 ඉ කො දෙ 3 ඉ පරි සැල

වගු අංක 14 එල්ලංගාව යෝජිත ක්‍රියාකාරී සැලැස්ම හා දළ ඇස්තමේන්තව - අමුණුකොලේ එල්ලංගාව

අනු අංක	දළ ඇස්තමේන්තුගත වියදම / සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් තම්මැන්නාව එල්ලංගාව	ආසන්න වියදම් (රු.)	2024/2025								
			ඔ/ නෙ	දෙ/ජ න	මා/ අප්‍රි	මැ/ ජ	ජ/අ	සැ/ ඔ	නෙ/ දෙ		
1	කට්ටකඩුව හා පෙරණය නැත. (Filter)	0.3									
2	වැවේ ජලයෙන් මාර්ගය යටවේ	0.2									
3	සොරොව්වෙන් ජලය කාන්දුවීම	0.3									
4	වාන සහ සොරෝව්ව කැඩී ඇත	0.2									
5	ඇලවල් කැඩී ඇත කුඹුරු වලට ජලය ලබා ගත නොහැකිය.	0.5									
6	වැව් වල මීරිදිය මත්ස්‍ය සම්පත නැත.	0.2									
7	ගොඩවල නැති නිසා වැව ගොඩවීම.	0.2									
8	වාන් ඇල හරහා කුඹුරු වලට ජලය ලබා ගැනීම නිසා ඇල කඩාගෙන යාම හා ජලය අපතේ යාම	0.2									
9	වැව් වල රදාපවතින ජලය වගාවට ප්‍රමාණවත් නැත . වැව් වල රොන් මඩ පිරිලා	0.7									

10	වාරිමාර්ග පද්ධතිය කැලෑවෙන් වැසී ඇත . නඩත්තු ඉතා දුර්වලයි	0.15									
11	අනවසරයෙන් වැව් රක්ෂිත අල්ලාගැනීම	0.2									
	එකතුව	3.15									